# බළන්ගොඩ ප්‍රාදේශීය සභාව
## 2022.12.31 දිනෙන් අවසන් වෂර්ය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. ආයතනික තොරතුරු:

1987.12.31 දින සිට දිස්ත්‍රික් සංවධර්න සභාව අහෝසි වීම හේතුවෙන් 1988.01.01 දින සිට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලදී.ප්‍රාදේශීය සභා කායර්ාලය බළන්ගොඩ කල්තොට පාරේ දිගදුර ග්‍රාමයේ පිහිටා ඇත. සෑම වසරකම දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන මාස 12 ක කාල පරිච්ඡේදය සඳහා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරනු ලබයි.

2022 දෙසැම්බර් 31 දිනට සථිර සේවක සංඛ්‍යාව 79 වන අතර, අනියම් කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සංඛ්‍යාව 07 ක්ද සේවය කරයි.

බළන්ගොඩ ප්‍රාදේශීය සභාව ග්‍රාම නිලධාරි කොට්ඨාශ 53 කින් සමන්විත තම බල ප්‍රදේශය වගර් කිලෝමීටර් 120 ක භූමි ප්‍රදේශයක වෙසෙන 90000 ක් පමණ වන ජනතාව උදෙසා තම සේවාවන් සපයයි.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

පවරන ලද බලතල අනුව සම්පත් කායර්ක්ෂමව හා සඵලමත් ලෙස යොදවමින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියළු වැසියන්ට අවශ්‍යවන්නා වූ පහසුකම් හා සේවාවන් ඔවුන් තෘප්තිමත් වන ආකාරයෙන් ඉටුකර අභිමානවත් පුරවරයක් නිමර්ාණය කිරීමය.

### 1.3 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කායර්සාධන ප්‍රකාශනය,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කොට ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධමර්වලට අනුකූලවයි.

### 1.4 සංසන්දනාත්මක තොරතුරු

සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදාගෙන ඇති අතර , ඒවා පෙර වෂර්යේ භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා අනුරූප වේ. වඩාත් යෝග්‍ය ඉදිරිපත් කිරීම අරඹයා වෂර්යේ ඉදිරිපත් කිරීම සමඟ අනුරූප වීමට අවශ්‍ය අවස්ථාවල සංසන්දනාත්මක තොරතුරු නැවත වගර් කර දක්වා ඇත.

### 1.5 මිණුම්කරණ පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත සභාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇති අතර මූල්‍ය ප්‍රකාශයන්ට බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් ගැලපීම් සිදු නොකර ඒකාකාරව යොදා ගන්නා ලදී.

### 1.6 ක්‍රියාකාරී හා ඉදිරිපත් කර ඇති මුදල් වගර්ය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ සභාවේ ක්‍රියාකාරී මුදල් වගර්ය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

## 1.7 ගිණුම් පිළිබඳ වැදගත් තීන්දු හා ඇස්තමේන්තු

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ " ගිණුම් ප්‍රතිපත්ති යොදා ගැනීමේ " බලපාන හා වාතර්ාගත වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වලට බලපාන තීරණ ගැනීමට ,ඇස්තමේන්තු කිරීමට හා උපදෙස් වලට එළඹීමට සභාවට සිදු වේ. සත්‍ය ප්‍රතිඵල මෙකී ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා යාවත්කාලීන උපකල්පන කාලීන පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම් ඇස්තමේන්තු වල සංශෝධිත ඇස්තමේන්තු ද සංශෝධනය කෙරෙන කාල පරිච්ඡේදය තුළ අදාළ සංශෝධන අතීත කාල පරිච්ඡේදයට බලපාන්නේ නම් අතීත කාල පරිච්ඡේද වලට අදාලව ගිණුම් කරනු ලැබේ.

## 2. දේපල පිරියත හා උපකරණ:

දේපල පිරියත හා උපකරණ යනු එක් වෂර්යකට වඩා පරිහරණය කරන බවට අපේක්ෂිත සේවාකරණය හා පරිපාලන අවශ්‍යතා සඳහා දරණ ස්පශර් කළ හැකි අයිතමයන්ය.

වත්කම් ලෙස හඳුනාගත් පිරිවැය හා උපකරණ අයිතමයන් පිරිවැයට වාතර්ා කර ඇත. වත්කම අත්පත් කර ගැනීමට ඍජුවම දරණ ලද වියදම් පිරිවැයෙහි අන්තගර්ත වේ.

## 3. ජංගම වත්කම්:

### 3.1 තොගය

අමුද්‍රව්‍ය තොගය පිරිවැය මිළට වාතර්ාගත කෙරේ.

### 3.2 ලැබිය යුතු ශේෂයන්

ණයගැති හා ලැබිය යුතු හා ශේෂයන් ඒවා උපලබ්ධි වන අගයට තක්සේරු කරනු ලැබේ.

### 3.3 මුදල් හා මුදල් සමාන විෂයයන්

මුදල් හා මුදල් හා සමාන විෂයයන් යන්නට අතැති මුදල් ශේෂය බැංකු වල ඇති ශේෂය ඇතුළත් වේ. ඒවා සුදුසු පරිදි මුහුණත වටිනාකම් අගය හෝ දළ අගය මත ගිණුම්ගත කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක:02 හි සඳහන් ඍජු පදනම මත පිළියෙළ කරනු ලැබේ.

## 4. වගකීම් හා ප්‍රතිපාදන:

මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි/ශේෂ පත්‍රයෙහි ජංගම වගකීම් ලෙස වගර් කර ඇති අතර , වාතර්ාකරණ දිනයෙන් පසු නිරවුල් කිරීමට නියමිත වගකීම් වේ. මෙම වගකීම් අදාළ නිරවුල් සිදු කරන අවස්ථාවේ උපලබ්ධි වූවා සේ සලකනු ලබන මුදල් අගයට සටහන් කරනු ලැබේ.

## 5. මූල්‍ය කායර් සාධන ප්‍රකාශය:

### 5.1 ආදායම

ආදායම හඳුනා ගැනීම හා මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක :01 හි විධි විධාන අනුව ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 5.2 ස්ථාවර තැන්පත් පොලී

සභාව විසින් ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු සඳහා ලැබෙන ආදායම මුදල් පදනම මත හඳුනා ගැනේ.

### 5.3 මුද්දර ගාස්තු

සභාවට ලැබෙන මුද්දර ගාස්තු ආදායම මුදල් පදනම මත හඳුනා ගැනේ.

### 5.4 වියදම්

වියදම් හඳුනා ගැනීම හා මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක:01 හි විධි විධාන අනුව වියදම් උපචිත පදනම මත ගණන් ගනු ලැබේ.වෂර්ය සඳහා වන ප්‍රාග්ධන වත්කම් ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යාම සඳහා වැය වූ සියළුම වියදම් ආදායමට ගලපනු ලැබේ.

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | | | සටහන් | 2021/12/31 | 2022/12/31 |
|---|---|---|---|---|---|
| (1) | 110 | ජංගම නොවන වත්කම් | 2 | 126,231,309.76 | 483,220,979.40 |
| (2) | | <u>ජංගම වත්කම්</u> | | | |
| | 120 | අතැති තොග | 3 | 2,666,009.48 | 2,880,038.67 |
| | 140 | සේවක ණය | 4 | 6,141,833.72 | 6,878,815.00 |
| | 160 | ආදායම් ණයගැතියෝ | 5 | 38,704,189.98 | 16,522,941.28 |
| | 170 | පෙර ගෙවුම් | 6 | 442,779.02 | 610,539.02 |
| | 180 | ආයෝජන | 7 | 2,726,032.38 | 12,679,856.10 |
| | 190 | මුදල් | 8 | 22,851,110.94 | 9,259,545.81 |
| | | ජංගම වත්කම් එකතුව | | **73,531,955.52** | **48,831,735.88** |
| (3) | අඩු කළා- ජංගම වගකීම් | | | | |
| | 230 | ණය හිමියෝ | 9 | 29,099,625.26 | 16,457,039.91 |
| | 240 | කලින් ලැබීම් | 10 | 31,118.28 | 8,376.61 |
| | 250 | ආපසු ගෙවිය යුතු තැන්පත් | 11 | 3,294,845.88 | 2,578,519.60 |
| | | ජංගම වගකීම් එකතුව | | **32,425,589.42** | **19,043,936.12** |
| | කාරක ප්‍රාග්ධන/ඌනකාරක ප්‍රාග්ධන | | | 41,106,366.10 | 29,787,799.76 |
| | ශුද්ධ වත්කම් | | | **167,337,675.86** | **513,008,779.16** |
| | <u>මුදල් යොදවන්නේ :</u> | | | | |
| | ජංගම නොවන වගකීම් | | | | |
| | 210 | සමුච්චිත අරමුදල හා සංචිත | 12 | 167,221,136.49 | 513,008,779.16 |
| | 220 | ණය ප්‍රාග්ධනය | 13 | 116,539.37 | - |
| | | | | **167,337,675.86** | **513,008,779.16** |

පිළියෙළ කළේ :            පරීක්ෂා කළේ :            අනුමත කළේ:

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2022.12.31 දිනට ශුද්ධ වත්කම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය**

| විස්තරය | ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකය (රු.) | සමුච්චිත අරමුදල (රු.) | ප්‍රදාන (රු) | සංචිත (රු) | එකතුව(රු) |
|---|---|---|---|---|---|
| 2022/01/01 දිනට ශේෂය | 126,231,309.76 | 40,989,826.73 | | | 167,221,136.49 |
| කාලච්ඡේදය සඳහා වන අතිරික්තය/ඌනතාවය | | 1,927,563.14 | | | 1,927,563.14 |
| වර්ෂය සඳහා ප්‍රදාන | 8,012,045.00 | | | | 8,012,045.00 |
| කාලච්ඡේදය සඳහා වන වත්කම් අත්පත් කරගැනීම් | 350,247,446.14 | 138,909.67 | | | 350,386,355.81 |
| කාලච්ඡේදය සඳහා වන ඉවත් කිරීම් | (1,269,821.50) | (99,858.30) | | | (1,369,679.80) |
| පෙර වර්ෂ ගැලපීම් (සටහන 14) | | 1,837,358.52 | | | 1,837,358.52 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම (සටහන 15) | | (15,006,000.00) | | | (15,006,000.00) |
| 2022/12/31 දිනට ශේෂය | 483,220,979.40 | 29,787,799.76 | | | 513,008,779.16 |

**<u>සටහන -14</u>**

| | |
|---|---|
| ජනර්ල් සටහන් අංක 6 | 1,007,550.00 |
| ජනර්ල් සටහන් අංක 12 | 187,471.32 |
| ජනර්ල් සටහන් අංක 16 | 1,053,025.65 |
| ජනර්ල් සටහන් අංක 19 | (178,225.65) |
| ජනර්ල් සටහන් අංක 22 | (204,641.80) |
| ජනර්ල් සටහන් අංක 24 | (17,921.00) |
| ජනර්ල් සටහන් අංක 47 | (9,900.00) |
| | 1,837,358.52 |

**<u>සටහන -15</u>**

මුද්දර ගාස්තු 2021 වර්ෂයේ උපචිත පදනමෙන් සටහන් වූ අතර 2022 වර්ෂයේ මුදල් පදනමෙන් ගිණුම්ගත කිරීම.
ජනර්ල් සටහන් 34 (15006000.00)

පිළියෙළ කළේ: පරීක්ෂා කළේ: අනුමත කළේ:

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය**

| | | | 2021.12.30 | 2022.12.31 |
|---|---|---|---|---|
| **(1)** | **පුනරාවතර්න ආදායම්** | | | |
| | 10 වරිපනම් හා බදු | | 1,051,400.50 | 1,083,058.80 |
| | 20 කුලී | | 4,517,336.66 | 6,222,837.00 |
| | 30 බලපත්‍ර ගාස්තු | | 1,021,960.00 | 881,370.00 |
| | 40 සේවාවන් සඳහා ගාස්තු | | 4,865,434.35 | 10,273,933.72 |
| | 50 වරෙන්තු ගාස්තු හා දඩ | | 4,667,391.00 | 4,666,928.72 |
| | 60 වෙනත් ආදායම් | | 15,741,233.70 | 28,717,448.42 |
| | 70 ආදායම් ආධාර | | 42,898,166.60 | 48,252,449.97 |
| | පුනරාවතර්න ආදායම් එකතුව | | **74,762,922.81** | **100,098,026.63** |
| **(2)** | **පුනරාවතර්න වියදම්** | | | |
| | 01 පෞද්ගලික පඩිනඩි | | 44,274,912.62 | 57,135,288.83 |
| | 02 ගමන් වියදම් | | 715,183.00 | 1,120,914.00 |
| | 03 සැපයුම් හා උපකරණ | | 7,948,111.55 | 13,616,168.22 |
| | 04 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | | 5,799,085.80 | 10,201,061.83 |
| | ප්‍රවාහන සම්බන්ධතා , ආවශ්‍යක සේවා | | | |
| | 05 හා වෙනත් සේවා | | 4,554,188.05 | 6,695,317.35 |
| | 06 පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | 202,088.76 | 150,215.81 |
| | 07 ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | | 268,805.33 | 477,770.18 |
| | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා | | | |
| | 08 පාරිතොෂිත | | 347,292.27 | 433,577.88 |
| | පුනරාවතර්න වියදම් එකතුව | | **64,109,667.38** | **89,830,314.10** |
| පුනරාවතර්න වියදමට වඩා වැඩි/අඩු පුනරාවතර්න ආදායම | | | 10,653,255.43 | 10,267,712.53 |
| **(3)** | **ප්‍රාග්ධන ආදායම්** | | | |
| | 81 මූලධන ආධාර | | 12,808,631.46 | - |
| **(4)** | **ප්‍රාග්ධන වියදම්** | | | |
| | 09 ප්‍රාග්ධන වැය | | 19,317,447.30 | 8,030,843.39 |
| | 09 පුස්තකාල පොත් මිලදී ගැනීම | | 302,000.00 | 309,306.00 |
| අතිරික්තය/ඌනතාවය | | සටහන-1 | **3,842,439.59** | **1,927,563.14** |

පිළියෙල කළේ: පරීක්ෂා කළේ: අනුමත කළේ:

**බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**විස්තරාත්මක ආදායම් වියදම් ගිණුම-2022**

සටහන 1

| | සාමාන්‍ය පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් | ජල සේවා | මහජන උපයෝගීතා සේවා | සුභ සාධන සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | |
| **(1) පුනරාවතර්න ආදායම්** | | | | | | | |
| 10 වරිපනම් හා බදු | 558,380.50 | 476,678.30 | | | | 48,000.00 | 1,083,058.80 |
| 20 කුලී | | | 4,221,521.00 | 24,000.00 | 1,977,316.00 | | 6,222,837.00 |
| 30 බලපත්‍ර ගාස්තු | 62,370.00 | 819,000.00 | | | | | 881,370.00 |
| 40 සේවාවන් සඳහා ගාස්තු | 3,850.00 | 3,583,000.00 | 471,008.72 | 18,000.00 | 6,194,700.00 | 3,375.00 | 10,273,933.72 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 4,655,144.00 | | | | 7,790.97 | 3,993.75 | 4,666,928.72 |
| 60 වෙනත් ආදායම් | 28,638,707.92 | 33,990.50 | 13,250.00 | 31,500.00 | | | 28,717,448.42 |
| 70 ආදායම් ආධාර | 31,961,718.42 | 5,790,303.81 | 7,610,822.74 | | | 2,889,605.00 | 48,252,449.97 |
| පුනරාවතර්න ආදායම් එකතුව | **65,880,170.84** | **10,702,972.61** | **12,316,602.46** | **73,500.00** | **8,179,806.97** | **2,944,973.75** | **100,098,026.63** |
| **(2) පුනරාවතර්න වියදම්** | | | | | | | |
| 01 පෞද්ගලික පඩිනඩි | 35,463,634.81 | 7,701,670.30 | 10,192,150.37 | | | 3,777,833.35 | 57,135,288.83 |
| 02 ගමන් වියදම් | 440,172.00 | 76,732.00 | 601,164.00 | | | 2,846.00 | 1,120,914.00 |
| 03 සැපයුම් හා උපකරණ | 6,136,975.22 | 2,851,292.00 | 4,330,326.00 | 168,730.00 | 31,125.00 | 97,720.00 | 13,616,168.22 |
| 04 ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 1,855,166.19 | 534,167.01 | 6,265,897.70 | 110,422.13 | 1,430,808.80 | 4,600.00 | 10,201,061.83 |
| 05 ප්‍රවාහන සම්බනධතා , ආවශ්‍යක සේවා හා වෙනත් සේවා | 2,491,246.74 | 2,356,560.89 | 144,605.57 | | 1,491,209.66 | 211,694.49 | 6,695,317.35 |
| 06 පොළී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 147,885.03 | 2,330.78 | | | | | 150,215.81 |
| 07 ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 477,770.18 | | | | | | 477,770.18 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතොෂිත | 27,000.00 | 173,679.60 | 147,398.28 | | | 85,500.00 | 433,577.88 |
| පුනරාවතර්න වියදම් එකතුව | **47,039,850.17** | **13,696,432.58** | **21,681,541.92** | **279,152.13** | **2,953,143.46** | **4,180,193.84** | **89,830,314.10** |
| පුනරාවතර්න වියදමට වඩා වැඩි/අඩු පුනරාවතර්න ආදායම | | | | | | | **10,267,712.53** |
| **(3) ප්‍රාග්ධන ආදායම්** | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 81 | මූලධන ආධාර | | | - | | | | - |
| | | | - | - | | | - | - |
| | | | | | | | | **10,267,712.53** |
| **(4)** | **ප්‍රාග්ධන වියදම්** | | | | | | | |
| 09 | ප්‍රාග්ධන වැය | 2,541,570.00 | 535,446.00 | 3,950,745.39 | | 1,002,082.00 | 1,000.00 | 8,030,843.39 |
| 09 | පුස්තකාල පොත් මිලදී ගැනීම | | | | | | 309,306.00 | 309,306.00 |
| | අතිරික්තය/ඌනතාවය | | | | | | | **1,927,563.14** |

පිළියෙළ කළේ: පරීක්ෂා කළේ: අනුමත කළේ:

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | 2021.12.31 | 2022.12.31 |
|---|---|---|
| **<u>මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| **ලැබීම්:** | | |
| වරිපනම් හා බදු | 1,080,233.76 | 1,030,861.22 |
| කුලී | 4,262,890.26 | 5,934,426.24 |
| බලපත්‍ර ගාස්තු | 922,580.00 | 896,120.00 |
| අනෙකුත් සේවා සැපයීම් | 4,866,934.35 | 10,253,787.54 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 4,761,140.50 | 4,736,994.90 |
| වෙනත් ආදායම් | 7,549,471.66 | 28,071,105.17 |
| ආදායම් ආධාර | 40,565,132.59 | 49,166,325.62 |
| අනෙකුත් ලැබීම් | 19,287,704.56 | 15,515,045.00 |
| | **83,296,087.68** | **115,604,665.69** |
| **ගෙවීම්:** | | |
| පෞද්ගලික පඩිනඩි | (44,143,183.62) | (56,797,818.83) |
| ගමන් වියදම් | (696,273.00) | (1,097,714.00) |
| සැපයුම් සඳහා ගෙවීම් | (7,861,045.55) | (14,596,941.72) |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | (3,840,756.36) | (9,305,422.63) |
| ප්‍රවාහන සම්බනධතා , ආවශ්‍යක සේවා හා වෙනත් සේවා | (3,416,014.98) | (4,206,209.75) |
| පොළී ගෙවීම් | (202,088.76) | (150,215.81) |
| සහනාධාර | - | (474,550.00) |
| විශ්‍රාම වැටුප් | (396,595.95) | (415,381.56) |
| අනෙකුත් ගෙවීම් | (26,194,892.23) | (36,949,703.15) |
| | **(86,750,850.45)** | **(123,993,957.45)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **(3,454,762.77)** | **(8,389,291.76)** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| සථාවර වත්කම් අත්පත් කර ගැනීමට මිළදී ගැනීමට හෝ සථාවර තැන්පත් ආපසු ගැනීම | (4,482,584.81) | (5,085,734.00) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **(4,482,584.81)** | **(5,085,734.00)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| ප්‍රාග්ධන ආධාර ලැබීම් | 1,357,965.60 | - |
| දේශීය ණය සංවධර්න අරමුදල(LLDF) ණය ආපසු ගෙවීම | (443,750.29) | (116,539.37) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **914,215.31** | **(116,539.37)** |
| මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/(අඩුවීම) | (7,023,132.27) | (13,591,565.13) |
| කාලපරිච්ඡේදය ආරම්භ වූ මුදල් හා මුදල් සමාන දෑ | 29,874,243.21 | 22,851,110.94 |
| කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | **22,851,110.94** | **9,259,545.81** |

| | 2021.12.31 | 2022.12.31 |
|---|---|---|
| **බැංකු ශේෂයන්:** | | |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම-2246695 | 29,432,190.77 | 25,879,511.87 |
| | **29,432,190.77** | **25,879,511.87** |

පිළියෙළ කළේ: පරීක්ෂා කළේ: අනුමත කළේ: